1998

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 7 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................ විභාග අංකය :- ..........................

සැලකිය යුතුයි:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- I හා II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

## I කොටස

- පහත කළු අකුරෙන් මුද්‍රිත සාම්ප්‍රදායික යෙදුම්වලට ගැළපෙන පිළිතුරු තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

(01) දක්ෂ දරුවෙකු වූ නාලකට දැඩි සතුටක් ඇති වූයේ තමා විභාගය සමත් වන බව ස්ථිරව ම දැන සිටි නිසා ය.

(1) සන්තෝෂයක් , විශ්වාසයක් (2) ඉහේ මලක් පිපිලා , සිකුරට ම
(3) ප්‍රීතියක් , බලාපොරොත්තුවක් (4) සතුටක් , අධිෂ්ඨානයක්

(02) කිසිවෙකුට ප්‍රයෝජනයක් නැති නිෂ්ඵල කටයුත්තක් කිරීම හඟවන ප්‍රස්තාව පිරුළ තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ගඟ මැද දී අත්වැල කැඩුව වගේ (2) කිරි ගහට ඇන්නා වගේ
(3) වක්කඩේ හකුරු හැංගුවා වගේ (4) පැණි හැළියට වැටුණු ඇඹලයා වගේ

(03) ජීවනෝපාය, අපරදිග, ප්‍රචලිත යන පදවල සමාන පද නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) රැකියාව, බටහිර, ප්‍රසිද්ධ (2) වෘත්තිය, නැගෙනහිර, ප්‍රචාරය වූ
(3) සේවය, දකුණ, පළ වූ (4) සේවය, දකුණ, පැතිරුණු

(04) දඟ කරමින් නට නටා
ඇවිදින මුළු ලොව වටා
ගඳඹ කුමරියකි මොළ කැටී
ඇති සුරතල් ගති තුරා

ඉහත පද්‍යයේ ඇති සඤ්ඤක අක්ෂර ගණන වන්නේ,

(1) හතරකි. (2) තුනකි.
(3) පහකි. (4) දෙකකි.

(05) ප්‍රමු☐ අවබෝ☐ය පුස්☐කාලය යන වචනවල හිස්තැන්වලට යෙදිය යුතු නිවැරදි අක්ෂර සහිත වරණය වන්නේ,

(1) ක , ද , ඨ (2) ඛ , ධ , ඨ
(3) ඛ , ධ , ත (4) ක , ද , ත

- හිස්තැනට ගැළපෙන වචනය තෝරා තිත් ඉර මත ලියන්න.

අවුරුදු උත්සවයේ (06) .................................. ( කබ , කඹ ) (07) .................................. ( ඇදීමේ , ඇඳීමේ ) තරඟය (08) .................................. (සැදෑ , සැඳෑ ) වරුවේ පැවැත්විණි.

(09) වී ගොවිතැන හා බැඳුනු බස් වහරේ කමතේ දී, ආප්ප, තේ කහට, හකුරු යන ආහාර පාන හඳුන්වන්නේ,

(1) කුඹල් ගෙඩිය, කළු ගඟුල, ඇඹුල යනුවෙනි.

(2) කිරි කබළු, රතු ගඟුල , රසබෝජ්‍ය යනුවෙනි.

(3) පැඟිරි බෝජ්‍ය , රතු ගඟුල , ඇඹුල යනුවෙනි.

(4) පැඟිරි බෝජ්‍ය , කළු ගඟුල , රසබෝජ්‍ය යනුවෙනි.

(10) කළු අකුරින් මුද්‍රිත පුරුෂ ලිංග පදවලට ගැළපෙන ස්ත්‍රී ලිංග නාම පද ඇතුළත් පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

**අශ්වයා** පිට නැගී **සෙබළා** වේගයෙන් අසු පන්නා ගෙන ගියේ **පාලකයා** හමුවීමට ය.

(1) බූරුවා , සෙබඩ , පාලිතයා ය.

(2) වෙළඹ , සෙබඩ , පාලිතයා ය.

(3) වෙළඹ , සෙබළී , පාලිකාව ය.

(4) බූරුවා , සෙබඩ , පාලිතයා ය.

(11) ලේඛකයෝ , කුරුල්ලෝ , සමනල්ලු යන උක්ත පදවල අනුක්ත රූපය නිවැරදිව යෙදී ඇති පද පෙළිය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ලේඛකයින් , කුරුල්ලන් , සමනලුන්

(2) ලේඛකයන් , කුරුල්ලන් , සමනලයන්

(3) ලේඛකයන් , කුරුල්ලන් , සමනලයින්

(4) ලේඛකයන් , කුරුල්ලන් , සමනලයන්

(12) පහත දැක්වෙන වාක්‍යයේ කළු අකුරින් මුද්‍රිත පදවලට ගැළපෙන විරුද්ධාර්ථවත් පද යෙදී ඇති පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

ගුරුතුමිය ගණිතය පාඩමේ දී **සරල** ගැටලු විසඳීමට කියා දුන්නත් **බොහෝ** දෙනෙකුගේ පිළිතුරු **සාවද්‍ය** විය.

(1) සංකීර්ණ, ටික, නිරවද්‍ය

(2) සංක්ෂිප්ත, ගොඩක්, නිරවද්‍ය

(3) බහුල, වැඩි, අසාධ්‍ය

(4) සංකීර්ණ, ගොඩක්, නිරවද්‍ය

(13) පහත වාක්‍යයේ කළු අකුරින් මුද්‍රිත පදවලට ගැළපෙන තනි පද ඇතුළත් පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

අත්තම්මා දැත් **සෝදා** මල් **පුදමින්** ගාථාවක් ශබ්ද නගා **කීවා** ය.

(1) අවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(2) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා

(3) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා

(4) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා

(14) කළු අකුරින් මුද්‍රිත පදවලට ගැළපෙන තනිපද ඇතුළත් පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

**පළමු වතාවට** සිරිපා **කරුණා කරන්නා** සීත ගඟුල අසල පිහිටි **ගලෙහි** කෙටූ ලියවිල්ල කියවූයේ **කණ්ඩායමේ නායකයාට** ඇසෙන පරිදි ය.

(1) පළමු වැන්නා, දැන්වීම, නායකයා

(2) කෝඩුකාරයා, සෙල්ලිපිය, නඩේගුරා

(3) කරුණාවන්තයා, මුල්ගල, නායකයා

(4) පළමුවෙනියා, පුවරුව, අණදෙන්නා

135

(15) ලොකු අයියා මිහිරි ගීයක් ගයමින් බයිසිකලය හෙමින් පැද්දේ ය.

ඉහත වාක්‍යයේ කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ව්‍යාකරණ වර්ගය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) නාම විශේෂණ , ක්‍රියා විශේෂණ , ක්‍රියා විශේෂණ

(2) ක්‍රියා විශේෂණ , ක්‍රියා විශේෂණ , නාම විශේෂණ

(3) නාම විශේෂණ , නාම විශේෂණ , ක්‍රියා විශේෂණ

(4) ක්‍රියා විශේෂණ , නාම විශේෂණ , නාම විශේෂණ

(16) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට සුදුසු විරාම ලකුණු ඇතුළත් පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

- ශ්‍රී ලංකාවේ මුල් ම රාජධානි ත්‍රිත්වය ☐ අනුරාධපුරය, පොළොන්නරුව හා දඹදෙණියයි.
- දේවානම්පියතිස්ස රජතුමාගෙන් පසු රජ වූ උත්තිය රජ ක්‍රි.පූ. 207 ☐ 197 දක්වා රාජ්‍යය කරන ලදී.
- දිනකට පෙති ☐ කරල් එක බැගින් කෑමට පෙර ☐ පසු බොන්න.

(1) දෙතිත, කෙටි ඉර, ඇල ඉර, ඇල ඉර (2) තිත, දිග ඉර, කෙටි ඉර, ඇල ඉර

(3) කොමාව, දෙතිත, ඇල ඉර, ඇල ඉර (4) කොමාව, දිග ඉර, කෙටි ඉර, කෙටි ඉර

(17)

බාලොලි ලොලි බිළිඳු පුතේ
බාසුරු වන් බුහුටි පුතේ
පායන හිරු සදිසි පුතේ
රට බාරයි නුඹට පුතේ

කවියක අක්ෂර යොදා ඇත්තේ කිසියම් ශබ්ද රටාවකට අනුව ය. එම ශබ්ද රටාව හඳුන්වන්නේ,

(1) එළිසමය යනුවෙනි. (2) විරිත යනුවෙනි.

(3) අනුප්‍රාසය යනුවෙනි. (4) රූපක යනුවෙනි.

(18) 'අම්මා සඳකි
මම ඒ ලොව හිරු ය රිදී
ඒ ඉර හඳෙන්
නුඹේ ලෝකය එළිය වුණි'

ඉහත ගීතයේ රසවත් බව ඇතිවීමට යොදා ගෙන ඇති කාව්‍ය අලංකාරය වන්නේ,

(1) උපමා ය. (2) රූපක ය. (3) තාලය ය. (4) අනුප්‍රාසය ය.

(19) නිවැරදි ලෙස පද බෙදා ලියා ඇති පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

(1) ආහාර පිසීමේ දී සුදුරු මහදුරු සේ ම රම්පේ ද එකතු කර ගනිති.

(2) ලාංකිකයාගේ සාමාන්‍ය බීම වතුර ය.

(3) එස්. මහින්ද හිමියෝ පර සිරිතට ගැති වූ සිංහලයාට එරෙහිව සිය කවිය මෙහෙයවී ය.

(4) ගංවතුරෙන් විපතට පත්ව අසරණවූ අයට සහනාධාර සැපයිණි.

(20) පෙළ පොතේ එන දාවිත් රාලහාමි, ආචාර්ය ජී.ඩබ්ලිව්. අදිකාරම්, කුලතුංග දරුවා යන චරිත ඇතුළත් පාඩම් පෙළ තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

(1) දුං දුමටයි අඟුරු මටයි, සුදන ගුණ, නිවේදන

(2) සිනා කුමාරි, දෙව්දම් ඇදුරු එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමි, යහළුවෝ

(3) ඔයි රයිරේ ඔයි රාමා, යහළුවෝ, සසුන බැබළ වූ සරණංකර සඟ රජ තෙරණුවෝ

(4) නිවේදන, යහළුවෝ, දුං දුමටයි අඟුරු මටයි.

(ලකුණු 2 × 20 = 40)

136



The National e-Learning Portal for The General Education

## II කොටස

- 01 හා 02 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.
  3, 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

(01) පන්ති කාමර ඇගයීම් ප්‍රභේදයක් ලෙස ඔබ සකස් කළ බිත්ති පුවත්පත ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(1) ඔබ සකස් කළ බිත්ති පුවත්පතට යොදා ගත් තේමාව හෝ කලාපයට යෙදූ නම කුමක් ද? (ලකුණු 01)

(2) එකී බිත්ති පුවත්පතට ඇතුළත් කළ නිර්මාණ තුනක නම් ලියන්න. (ලකුණු 03)

(3) බිත්ති පුවත්පත නිර්මාණය කිරීමේ දී ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් 3ක් ලියන්න. (ලකුණු 03)

(4) එම නිර්මාණය සකස් කිරීමේ දී ඔබ සැලකිල්ලට ගත් මූලික කරුණු 3ක් ලියන්න. (ලකුණු 03)

(5) ඒ සඳහා තොරතුරු ලබාගත් මූලාශ්‍ර 3ක් දක්වන්න. (ලකුණු 03)

(6) මෙම ක්‍රියාකාරකමෙහි නිරත වීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන 3ක් ලියන්න. (ලකුණු 03)

(ලකුණු 16)

(02) පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150කට නො අඩු වන සේ රචනයක් ලියන්න.

(1) අභිකුණ්ඨික රැහේ අප ගමට ආ දා

(2) අපේ ගොයම් කයිය අදයි.

(3) උඳුවප් පෝ දා - සිරි පා වැන්දෙ

(4) මේ අපේ උදාර වූ මාතෘ භූමියයි.

(5) පාසල් පුස්තකාලයෙන් උපරිම ප්‍රයෝජන ගනිමු. (ලකුණු 14)

(03) පහත දැක්වෙන ගීතය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නිල කොබෙයි රැන ඇදී'
වී අවුලන ඉපනැල්ලේ
මාල ගිරවු රංචු ගැසිලා
නව අවුරුදු ගීත ගයනවා

වක්කඩ ළඟ දිය සුළියේ
තිත්ත පැටවු කලබලයේ
ඒ තාලෙට වරල් සලාලා
නව අවුරුදු නැටුම් නටනවා

ඔංචිලි චිලි චිල්ල මලේ
වැල්ල දිගට තෙල්ලි කැලේ
මලින් පලින් ගහකොළ පිරිලා
ගම්මානෙට අවුරුදු එනවා

නා වැටිය ම දලු දමලා
නා අතු අග මල් පිපිලා
බාල ලියන් ටිකිරි හිනා වී
ගමින් ගමට එළිය ගෙනාවේ

(1) මේ ගීතයෙන් කියවෙන්නේ අවුරුද්දේ කුමන කාලයක් පිළිබඳව ද?
(2) එම කාලයේ දී පරිසරයේ හා සතුන්ගේ ඇතිවන වෙනස්කම් එක බැගින් ලියන්න.
(3) ගීතයේ ගොයම් කැපීමෙන් පසු ගොයම් ගසේ ඉතිරි කොටස හඳුන්වා ඇත්තේ කිනම් නමකින් ද?
(4) ඔංචිලි චිලි චිල්ල මලේ
වැල්ල දිගට නෙල්ලි කැලේ...... යනුවෙන් ශබ්ද එකිනෙකට නින්නාද වන අයුරින් යොදා ඇති කාව්‍ය අලංකාර ක්‍රමය හඳුන්වන්නේ කිනම් නමකින් ද?
(5) ගීතයේ ඇතුළත් පහත දැක්වෙන පදවල අර්ථය ලියන්න.
(1) වක්කඩ (2) ඇදී (ලකුණු 2 × 5 = 10)

(04) ඔබ පාසලේ පැවැත්වීමට නියමිත වාර්ෂික අධ්‍යාපන ප්‍රදර්ශනයට සහභාගි කර ගැනීමට බලාපොරොත්තු වන්නන් වෙත යැවීමට සුදුසු නිර්මාණාත්මක ආරාධනා පත්‍රයක් සකස් කරන්න. (ලකුණු 10)

(05) පෙළ පොත ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
'ඇයි මෑණියනි, මම කුමන අන්‍යායක් කෙළෙම් ද?'
(1) ඉහත ප්‍රකාශය කළේ කවුරුන් ද?
(2) එසේ පැවසුවේ කාට ද?
(3) ඉහත පාඨයේ අන්‍යායක් යනු කුමක් ද?
(4) මෙම කතාව ඇතුළත් මුල් කෘතිය නම් කරන්න.
(5) එම කෘතිය රචනා වී ඇත්තේ කාගේ ඉල්ලීමක් අනුව ද? (ලකුණු 2 × 5 = 10)

(06) පහත දැක්වෙන පාඨ උපුටා ගත් ග්‍රන්ථය හෝ නිර්මාණය, කතුවරයාගේ හෝ නිර්මාණකරුවාගේ නම ලියන්න.

| | පාඨය | උපුටා ගත් ග්‍රන්ථ නිර්මාණය | කතුවරයා/ නිර්මාණකරුවා |
|---|---|---|---|
| 1 | 'එහෙ ගියොත් සුදු අප්පොත් එක්ක සෙල්ලම් කර නැකි' | ............................ | ............................ |
| 2 | කෙනෙකුන් කළ ගුණය<br>අමතක වීම නරකයි<br>අගුණ කළ විටක දි<br>වහා අමතක වීම යහපති | ............................ | ............................ |
| 3 | නෙලුම් මලේ පෙති සලා<br>පුබුදුවමින් නොම තළා | ............................ | ............................ |
| 4 | සුරරද සමන් සමඟින් සුරඟන පවර<br>පැහැ නද මදාරා පරසතු මල් පතර | ............................ | ............................ |
| 5 | පනම් හතයි - ගජ ලාබයි<br>හැම එකක් ම - එක ම මිලයි | ............................ | ............................ |

(ලකුණු 2 × 5 = 10)

(07) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශිෂ්ටාචාරයේ ආදි ම යුගයේ සිට සර්ම කලාපීය මිනිසා වෘක්ෂ ස්වකීය ගිමන්පළ වශයෙන් පමණක් නොව, ඇතැම් විට ස්වකීය ලැගුම්පළ වශයෙන් ද යොදා ගත්තේ ය. අතුපතර විහිදී ඇසටු වර්ගයේ වෘක්ෂ මූල ආදි මිනිසාගේ නිවහන බවට පවා පත්වන්නට ඇත. 'වෘක්ෂ දේවතාවා' හෙවත් 'රුක් දෙවියා' පිළිබඳ සංකල්පය හට ගත්තේ ද මිනිසාට තුරු සෙවණ මහෝපකාරී වූ නිසා විය හැකි ය. මිනිසාට ස්වකීය ගෘහයෙන් බැහැර ව ගමන් යන කල අතරමඟ ගිමන් හැරීම පිණිස කිසියම් නිශ්චිත ස්ථානයක අවශ්‍යතාව දැනෙන්නට ඇත. එවැනි ගමන් බිමන්වල දී ඔහු සෙවණ දෙන ගසක් තෝරා ගන්නා ලද්දේ නිරායාසයෙන් ම විය යුතු ය. එය තමන්ට අවශ්‍ය ආකාරයට සකස් කර ගන්නට ද ඇත. ඒ ගස්වල තම නම ගම් සහ සටහන් පවා කොටන්නට ඇත. ත්‍රිපිටක සාහිත්‍යයේ ද ඇතැම් විස්තරවලින් මේ අදහස් සනාථ වෙයි.

(1) ආදි ම යුගයේ මිනිසා තමන්ගේ ගිමන්පළ වශයෙන් යොදා ගත්තේ කුමක් ද?
(2) 'රුක් දෙවියා' යන සංකල්පය බිහිවූයේ කෙසේ ද?
(3) අතීතයේ දී මිනිසා වෘක්ෂය තම නිවහන කරගත් බවට පවතින සාක්ෂි කවරේ ද?
(4) ආදි මිනිසාගේ නිවහනක් ලෙස යොදා ගත් ගස් වර්ගයක නමක් ලියන්න.
(5) පහත පදවලට සමාන පද ලියන්න.
(i) ස්වකීය (ii) නිරායාසයෙන් (ලකුණු 2 × 5 = 10)